# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1814/36 - 2013 ජූනි මස 11 වැනි අඟහරුවාදා - 2013.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

මුරුගයියා යෝගේෂ්වරී නම් වූ සභිකයා අයත් වන්නා වූ එක්සත් ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු වන අට්පුදරාජ් පෙරුමාල් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී හෙට්ටියාකන්දගේ අරුණපුෂ්ප සෞම්‍යසිරි ප්‍රනාන්දු වන මම, අට්පුදරාජ් පෙරුමාල් මහතා නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

හෙ. අ. සෞ. ප්‍රනාන්දු,<br>
තේරීම්භාර නිලධාරී,<br>
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2013 ජූනි මස 07 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
නුවරඑළිය.

06 - 689


1A - G 17777 — 350 (2013/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*